Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# මහජන පුස්තකාල පිළිබඳ ඉෆ්ලා යුනෙස්කෝ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අන්තර්ගත කරුණුවල භාවිතය පිළිබඳ අධ්‍යයනයක් (කොළඹ, කුරුණෑගල, ගම්පහ මහජන පුස්තකාල ඇසුරින්)

***කේ.වී.ඒ.අයි.දඅල්විස්[1]***
***ඩබ්.කේ.එම්.එම්.කේ.වීරසිංහ[2]***

**සංක්ෂේපය**

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ මෙරට මහජන පුස්තකාල සේවාවන්ගේ ගුණාත්මක භාවය පිළිබඳව අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා පර්යේෂණ ගැටලුව ලෙස යොදා ගනු ලැබුවේ මහජන පුස්තකාල පිළිබඳ ඉෆ්ලා යුනෙස්කෝ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අන්තර්ගත කරුණ ලංකාවේ මහජන පුස්තකාල සඳහා කොතෙක් දුරට අදාළ කරගෙන ඇතිද යන්නයි. මෙම පර්යේෂණයේ උපන්‍යාසය ලෙස යොදා ගනු ලැබුවේ ලංකාවේ මහජන පුස්තකාල තුළ ඉෆ්ලා යුනෙස්කෝ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අන්තර්ගත කරුණුවල භාවිතය අවම මට්ටමක පවතින බවයි.

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ඉෆ්ලා සංවිධානය විසින් මහජන පුස්තකාල සංවර්ධනය සඳහා ඉදිරිපත් කළ ප්‍රඥප්තියෙහි අඩංගු කරුණු ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල විසින් කොතෙක් දුරට භාවිතයට ගෙන ඇතිද යන්න පිළිබඳව කොළඹ, ගම්පහ සහ කුරුණෑගල මහජන පුස්තකාල ඇසුරින් අධ්‍යයනය කිරීමය. උප අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවාව පිළිබඳ අවබෝධය ලබා ගැනීම, තෝරාගත් මහජන පුස්තකාලවල මෙතෙක් සිදු වී ඇති සංවර්ධනය අධ්‍යයනය කිරීම, උපයෝජක සේවාව පිළිබඳ අධ්‍යයනය කිරීම, මහජන පුස්තකාල සේවා සංවර්ධනයට ඇති බාධා හඳුනා ගැනීම, මහජන පුස්තකාල සේවාවන් ගුණාත්මක බවින් ඉහළ මට්ටමකට ගැනීම යන ඒවාය.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොළඹ, කුරුණෑගල සහ ගම්පහ මහජන පුස්තකාල තුනෙහි පුස්තකාලයාධිපතීන් සහ උපයෝජකයින් සංගහණය ලෙස තෝරා ගන්නා ලදී. මෙම පුස්තකාල තුනෙහි පුස්තකාලයාධිපතීන් සහ උපයෝජකයින් 30 දෙනෙකු සම්භාවී නොවන නියැදි ක්‍රමය යටතේ පහසු නියැදිම මගින් තෝරා ගන්නා ලදී. ප්‍රාථමික දත්ත එක් රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමයන් භාවිත කළ අතර ද්විතීයික දත්ත ලබා ගැනීම සඳහා පොත්පත්, වාර සඟරා, වාර්තා, ඉලෙක්ට්‍රොනික මූලාශ්‍රය භාවිත කරන ලදී. ක්ෂේත්‍රයේදී ලබා ගත් ප්‍රාථමික දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ලැබුණු ප්‍රධාන නිගමනය වූයේ ඉෆ්ලා යුනෙස්කෝ ප්‍රඥප්තියෙහි අඩංගු වන කරුණු 12 න් වැඩි ප්‍රමාණයක් මෙම පුස්තකාල තුළ විධිමත්ව ක්‍රියාත්මක නොවන බව හා උපයෝජකයන් ද මහජන පුස්තකාලවලින් තමාට ලැබෙන සේවාව පිළිබඳව තෘප්තිමත් නොවන බවයි. පර්යේෂණයේ අවසන යෝජනා ලෙස ඉදිරිපත් කරන ලද්දේ පාඨක අධ්‍යාපන වැඩසටහන් පුළුල් කරමින් උපයෝජක ප්‍රජාව පුස්තකාල සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම, පුස්තකාල තුළ පරිගණක හා අන්තර්ජාල පහසුකම් වර්ධනය කිරීම, කියවීම තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සහ කාර්ය මණ්ඩලය උපයෝජකයින් හා සුහදශීලීව ගනුදෙනු කිරීම ආදි කරුණු ය. මෙම යෝජනා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් මහජන පුස්තකාල සේවාව වඩාත් ඵලදායීව හා කර්යක්ෂම අයුරින් භාවිතයට ගැනීමට ප්‍රබල ලෙස දායක වන බව පරියේෂණය මගින් අවධාරණය කෙරේ.

**ප්‍රමුක පද :ඉෆ්ලා, මහජන පුස්තකාල, ශ්‍රී ලංකාව, උපයෝජකයින්**

1 පුස්තකාල සහ විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2 මහාචාර්ය, පුස්තකාල සහ විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව